# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**AAT/ 16 /2024 (PSC)**

එන්.එල්.එස්.ප්‍රසන්න
**අභියාචක**
**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
**වගඋත්තරකරු**

**දිනය :-2026.05.06**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක එන්.එල්.එස්.ප්‍රසන්න,
අභියාචක පෞද්ගලිකව පෙනී සිටී
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර බී.කේ.ඩී.එන්.ජයතිස්ස මිය.

## -<u>නියෝගය</u>-

## ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය

අභියාචක 2005.06.27 දින උපාධිධාරී පත්කිරීම් යටතේ සැලසුම් හා මුල්‍ය සහකාරවරයෙකු ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයට පත්වීම් ලැබ ඇත. දැනට මහාමාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශයේ ගිණුම් සංවර්ධන නිලධාරියෙකු ලෙස සේවය කරයි. අභියාචකගේ ඉල්ලීම වන්නේ, කාර්යක්ෂමතා කඩඉම සමත්වීම මත තම සේවය ස්ථිර කරන ලෙස ඉල්ලා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් මඟින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කළ තම ඉල්ලීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳවය. එම තීරණයෙන් තෘප්තිමත් නොවූ අභියාචක, 2024.04.01 දින මෙම අධිකාරයට අභියාචනයක් ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ,

**"මේ දක්වා පත්වීම ස්ථිර නොකර වසර 16කට ආසන්න කාලයක් වැටුප් වර්ධක අත්හිටුවීම තුල හා දැනට රටේ පවතින දරාගත නොහැකි ජීවන වියදම තුල මා හට සිදුව ඇති අගතිය සම්බන්ධයෙන් කාරුණික ඔබගේ අවධානය යොමු කර, මෙහි දක්වා ඇති ඇමුණුම් මඟින් තහවුරු වන කරුණු හා මා විසින්**

**ඉදිරිපත් කර ඇති කරුණු ද සැලකිල්ලට ගෙන මා අතින් යම් අතපසුවීමක් සිදුවී ඇත්නම් අවවාදයක් ලෙස මාගේ නවත්වා ඇති වැටුප් වර්ධක වලින් යම් ප්‍රතිශතයක් අඩු කර මා හට පළමු දින සිට පත්වීම ස්ථිර කර දෙන ලෙසත්, පළමු කාර්යක්ෂමතා පරීක්ෂණයට අදාළ විෂයන් සමත්ව ඇති බැවින් හා අන්තර්ග්‍රහණය ද සිදුකර ඇති බැවින් නැවත කඩඉම් පරීක්ෂණය පෙනී සිටීම වළක්වා විධිමත් සාධාරණ පරීක්ෂණයක් නැවත සිදුකර මා විසින් ඉල්ලා සිටින සහනය ලබාදෙන ලෙස ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.**" යනුවෙනි.

අදාළ අභියාචනයෙන් වැඩිදුරටත් ඔහු දන්වා සිටින්නේ, තමා සංවර්ධන සහකාර මූල්‍ය හා සැලසුම් සහකාර මූල්‍ය තනතුරු සඳහා පැවති කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලට,

2008.09.20 - අසමත්

2009.07.19 - අසමත්

2010.09.26 - අසමත්

පෙනී සිටි බවත්, ඉන් සමත් නොවූ බවත් ය. එසේම 2010.01.01 දින සිට සංවර්ධන නිලධාරී සේවයට අන්තර් ග්‍රහණය වූ බවත්ය. ඒ අනුව 2012.04.01 දින පැවති කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන්,

| | | |
|---|---|---|
| ආයතන කාර්ය පරිපාටිය | - | අසමත් |
| මුදල් රෙගුලාසි | - | සමත් |
| ඉංග්‍රීසි භාවිතය | - | සමත් |

බවත් ය.

පසුව 2011 වසරේ වැඩසටහන් නිලධාරී සේවා ව්‍යවස්ථාව යටතේ ඊට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළකල බවය. එම තනතුරේ සිටියදී පැවති කාර්යක්ෂමතා කඩඉම් විභාගය අනුව,

2016.12.22 කාර්යාල ක්‍රම - අසමත්

2019.11.30 කාර්යාල ක්‍රම - සමත් බවත් ය.

වැඩිදුරටත් අභියාචක ප්‍රකාශ කර සිටින්නේ, කෙසේ හෝ අවස්ථා කිහිපයකදී තමා විෂයන් 03 සමත් වී ඇති බැවින්, අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූවා සේ සළකන ලෙසය.

මේ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2025.05.08 හා 2026.04.21 දිනැති ලිපි මගින් තම තීරණයන් ඉදිරිපත් කර ඇත. ඒ තුළින් දන්වා සිටින්නේ, අදාළ පත්වීම් ලිපිය අනුව 11 හා 12 ඡේද අනුව වසර 03ක් තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු බවයි. එසේ වුවත් අදාළ වසර 03 තුළ අභියාචක විභාගය සමත් වී නැත. එසේම සංවර්ධන සහකාර තනතුරේ සිටිමින් ඊට අදාළ

කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණයේ විෂයන් 2/3ක් පමණක් සමත් වී ඇත. ඒ අනුව සම්පූර්ණ විභාගය සමත් වූ ලෙස සැළකීම අපහසුය.

එසේම සංවර්ධන නිලධාරි තනතුරට අදාළ කාර්යක්‍ෂමතා කඩඉම් විභාගයේ එක් විෂයක් පමණක් සමත්වී ඇත. මෙම අවස්ථා දෙක සමාන නොවන බවත්, ඒ අවස්ථා දෙක සඳහා බලපාන්නේ වෙනත් විෂය නිර්දේශයක් බවත් පැහැදිලි කර ඇත. 2012.02.14 දින ගැසට් පත්‍රය මගින් අදාළ විභාගය පිළිබඳව සහ ඊට අදාළ විෂයන් පිළිබඳව පැහැදිලිව සඳහන් කර ඇත. ඒ අනුව අවස්ථා දෙකකදී විෂයන් 03ක් සමත්වීම කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කිරීමක් ලෙස සැලකීමට අපහසු බව දන්වා සිටී. එමෙන්ම කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය නිදහස් කිරීම/සහන සැලසීම පිළිබඳවද අදාළ ලේඛන වල පැහැදිලිව සටහන් කර ඇත. අභියාචක අදාළ කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය සමත් වී ඒ පිළිබඳව සහන කාලයක් ඉල්ලා සිටීම වඩාත් සුදුසුය.

අභියාචකගේ අභියාචනයේ අවසානයේ සඳහන් පරිදි සානුකම්පිත හේතුන් මත කටයුතු කිරීමේ හැකියාවක් හෝ අතපසුවීම් සිදුවී තිබේ නම්, වැටුප් වර්ධක වලින් යම් ප්‍රතිශතයක් හෝ අඩුකර කටයුතු කිරීමේ හැකියාවක් ඇත්තේ නැත. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය නිවැරදි බව පිළිගැනීමට සිදුවේ. අභියාචනය ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරමු.

ඒ බැවි අභියාචක, ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

ජේ.ජේ.රත්නසිරි<br>
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි<br>
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්<br>
(සාමාජික)

ලලිතා/-